# 1 අපේ පැරණි ජන ජීවිතය

**හැඳින්වීම**

අපේ රටේ ඉතිහාසය ගැන තොරතුරු දැන ගැනීමට අපි බොහෝ ආශා කරමු. ඒ නිසා ඉතිහාසය පිළිබඳ ලියා ඇති පොත් පත්, පත්තර, සඟරා, කතන්දර ආදිය නිතර කියවීමට අපි පුරුදු වී සිටිමු. අතීතයේ අපේ රට පාලනය කළ රජවරුන්, භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ආගමික නායකයන්, පාලන කටයුතුවලට සම්බන්ධ නිලධාරීන් හා වැව් අමුණු ආදිය ගැන මේ වන විට අපි බොහෝ තොරතුරු දනිමු. මේ පාඩම යටතේ අතීතයේ අපේ රටේ ජීවත් වූ වැසියන්ගේ ජන ජීවිතයට අදාළ තොරතුරු ඔබට ඉදිරිපත් කෙරේ.

## ආර්ථිකය

අතීතයේ දී අපේ රටේ ජීවත් වූ ජනතාව ජීවනෝපාය සඳහා විවිධ වෘත්තීන්වල නියැලුණහ. ගොවිතැන, වෙළෙඳාම, විවිධ කර්මාන්තවල නියැලීම, සත්ව පාලනය එවැනි වෘත්තීන්වලට උදාහරණ වේ. එමගින් පුරාණ ජීවන රටාව ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් යටතේ සිදු විය.


- ☆ කෘෂිකර්මාන්තය
- ☆ කර්මාන්ත
- ☆ වෙළෙඳාම

## කෘෂිකර්මාන්තය

අතීතයේ අපේ රටේ සිටි බොහෝ දෙනෙක් ජීවත් වූයේ ගම්වල ය. ඔවුන් වර්තමාන ජනතාව මෙන් නොව ඉතා සරල ජීවිත ගත කළ පිරිසකි. ඔවුන්ගේ අවශ්‍යතාවන් ද සීමිත විය. යැපීම සඳහා අවශ්‍ය වන ආහාර පාන නිෂ්පාදනය කර ගැනීම ඔවුන් මුහුණ දුන් ප්‍රධාන අභියෝගයක් විය. මෙම අභියෝගය ජය ගැනීමට බොහෝදෙනා කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවන වෘත්තිය ලෙස තෝරා ගත්හ. එකල කෘෂිකර්මාන්තය හේන් වගාව හෙවත් ගොඩ ගොවිතැන හා කුඹුරු වගාව හෙවත් මඩ ගොවිතැන වශයෙන් ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු විය.

## හේන් වගාව

හේන් ගොවිතැන ගොඩ ගොවිතැන යනුවෙන් ද හඳුන්වනු ලැබේ. එදිනෙදා ජීවිතයේ යැපීම සඳහා අවශ්‍ය ධාන්‍ය, එළවළු, අල වර්ග වැනි දෑ හේන්වල වගා කෙරිණි. වර්ෂා ජලයෙන් හේන් වගා කටයුතු සිදු කර ඇත.





නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හේන් වගාව ලෝකයේ පැරණි ම ගොවිතැන් ක්‍රමය ලෙස ද සැලකේ. ශ්‍රී ලංකාවේ ද හේන් ගොවිතැන මෙරට වඩාත් පැරණි ගොවිතැන් ක්‍රමයක් ලෙස සැලකිය හැකි ය.

කැලෑ ගිනි තබා එළි පෙහෙළි කර සකස් කරගන්නා බිමක් හේනක් ලෙස හැඳින්වේ. උම්මග්ග ජාතකයේ **"සේන්"** යනුවෙන් ද සෙල්ලිපිවල **"පිටිබිම්"** යනුවෙන් ද අතීතයේ පැවති හේන් හඳුන්වා ඇත. හේනක් සඳහා තෝරාගන්නේ මහ කැලෑවේ බිමකි. එය ගොවීන් වාසය කරන ප්‍රදේශයෙන් තරමක් ඈත පිහිටා ඇත. හේනක් කෙටීම එක් ගොවියකු විසින් හෝ සාමූහිකව කිහිප දෙනෙකුගේ ශ්‍රමයෙන් ද සිදු කර ඇත.

කාවන්තිස්ස රාජ්‍ය සමයේ රුහුණු ප්‍රදේශයේ පිහිටි ගිරි නම් ජනපදයේ නිසෙල්විටිය ගමේ වාසය කළ එක්තරා පවුලක සහෝදරයන් පස් දෙනෙකු එකතු වී වනයක් එළි පෙහෙළි කර උඳු වැපිරීමට හේනක් සකස් කිරීම පිළිබඳ කතා පුවතක් මහාවංසයේ සඳහන් වේ.

හේනක් සකස් කර ගැනීමේ දී ගොවියාට ඉතා වෙහෙස මහන්සි වී කටයුතු කිරීමට සිදු විය. අස්වැන්න නෙළා ගැනීම දක්වා හේන් ගොවියා කළ යුතු කාර්යයන් කිහිපයකි.

**හේන් වගා කළ ආකාරය:**

1. හේනක් සකස් කිරීම සඳහා සුදුසු බිමක් තෝරා ගැනීම
2. කැලය කපා සුද්ද පවිත්‍ර කොට හේන ගිනි තැබීම
3. කණු මුල් උදුරා දැව දඬු ආදිය පුළුස්සා බිම සැකසීම

එලෙස අලුතින් ගිනි තබා සකස් කර ගත් භූමිය නවදැලි හේනක් ලෙස හැඳින්වේ.

එවැනි හේන් ඉතා සරුසාර කෘෂි බිම් ලෙස සැලකේ.



රූපය 1.1 නවදැලිහේන



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

4. අලි, ඌරන්, ගෝනුන්, ඉත්තෑවුන්, වඳුරන් වැනි වන සතුන්ගෙන් හේන ආරක්ෂා කර ගැනීමටත් අස්වැන්න නෙළා ගන්නා තුරු හේන හොඳින් රැකබලා ගැනීමටත් හේන් ගොවියාට සිදු විය. එහි දී හේන ආරක්ෂා කර ගැනීමට අතීත ගොවීහු විවිධ ක්‍රම අනුගමනය කළහ.

- ✦ දඬු වැට තැනවීම
- ✦ ගිනිමැල ගැසීම
- ✦ පැල් රැකීම

5. වර්ෂා කාලය එළඹෙන විට හේන්වල භෝග වගා කිරීම ඇරඹිණි. ඒවායේ බොහෝ විට කටුසර භෝග වගා කර ඇත. තණහාල්, මෙනේරි, කුරක්කන් වැනි ධාන්‍ය වර්ග එවැනි කටුසර භෝග කිහිපයකි. එසේ ම මුං, මෑ, අමු, ඉඟුරු, අබ, දුරු, ඇල් වී, තල, කපු, උක් ආදිය ද තිබ්බටු, වම්බටු, අළුපුහුල්, වට්ටක්කා වැනි එළවළු ද ඉන්නල, බතල වැනි අල වර්ග ද හේන්වල වගා කළ බව සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වේ.

මුල් කාලයේ දී වී වගාව ද හේන් වගාවක් ලෙස පැවතුණි. හේන්වල වගා කළ වී, ඇල් වී ලෙස හඳුන්වයි. ඇල් වී වගා කළ කෙත් හෙවත් හේන් ඇල් හේන් යනුවෙන් හඳුන්වයි. ඇල් හාල් පිළිබඳව පැරණි සාහිත්‍ය කෘතිවල සඳහන් වේ. දුටුගැමුණු රජුගේ පුත් සාලිය කුමාරයාට එම නම තබන ලද්දේ ඒ කුමරා උපන් කාලයේ ඇල් වී අස්වැන්න ඉහළ ගිය නිසා යැයි ***සීහළවත්ථු*** නම් පැරණි ග්‍රන්ථයේ දැක්වේ. සාලි යනු ඇල් වී වලට යොදන තවත් නමකි. අතීතයේ ඇල් වී ඇතැම් විට කුඹුරුවල ද වගා කෙරිණ. රත් ඇල්, බිබිළි ඇල්, ඉදි ඇල් ආදිය හේන්වල වගා කළ ඇල් වී වලට උදාහරණ වේ.

6. එක් වරක් හෝ දෙවරක් වගා කර අස්වැන්න නෙළා ගැනීමෙන් පසුව හේන අතහැර දමයි. හේන් බිම නැවතත් කැලෑවක් බවට පත්වන අතර හේන් ගොවියෝ වගා කටයුතු සඳහා වෙනත් බිම් ප්‍රදේශයක් තෝරා ගත්හ.

හේන් වගා කටයුතු සඳහා කැති, උදලු, දෑ කැති වැනි සරල උපකරණ භාවිත කර ඇත.



**රූපය 1.2 පැරණි යුගයේ භාවිතා කළ කෘෂි උපකරණ කිහිපයක්**

හේන් වගාවේ දී ගොවියා භාවිතා කළ විවිධ වචන ද අපට හමු වේ. අනුරාධපුර යුගය තරම් ඈත කාලයේ භාවිත කළ එබඳු වචන අද දක්නට නැතත් පහත සඳහන් මෑත කාලීන වචන හේන් බස් වහර තේරුම් ගැනීමට ප්‍රයෝජනවත් ය.

නවදැලි හේන - අලුතින් ගිනිතබා සකස් කළ හේන

ගිනි යාතිකාව - හේන ගිනිතැබීමට පෙර සතුන් පන්නා හැරීමට සිදු කළ කෑ ගැසීම

හැලි කටා - හිසට වළඳක් නමා සාදාගන්නා ලද පඹයා



රූපය 1.3 පඹයා

**ක්‍රියාකාරකම**

හේන් ගොවිතැන ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වගා කළ භෝග | විශේෂ ලක්ෂණ | භාවිත කළ උපකරණ | භාවිත කළ වචන |
|---|---|---|---|
| | | | |

## මඩ ගොවිතැන

හේන් වගාවට අමතරව අතීතයේ වඩාත් ප්‍රචලිතව පැවති වගා ක්‍රමය මඩ ගොවිතැන වේ. කුඹුරු ගොවිතැන, වාරි ගොවිතැන යන නම්වලින් ද මඩ ගොවිතැන හැඳින්වේ. මඩ ගොවිතැන බොහෝ විට වාරි ජලයෙන් සිදු කර ඇත. වැව් අමුණු ඉදි කර ඇළ මාර්ග ඔස්සේ කුඹුරුවලට ජලය ලබාගෙන තිබේ. වර්ෂා ජලයෙන් කුඹුරු වගා කිරීම ද සුළු වශයෙන් සිදු විය.

පවුලක යැපීම සඳහා කුඹුරක් වගා කිරීමට පවුලේ ශ්‍රමය ප්‍රමාණවත් වුවත් ජනගහනය වැඩි වීමත් සමග වගා කළ බිම් ප්‍රමාණය ද වැඩි කිරීමට සිදු විය. අනුරාධපුර රාජධානි අවදියේ සෑම ගමකට ම එක් වැවක් බැගින් තිබූ බව සොයාගෙන ඇත. මෙම වැව් ගම් වැව් යනුවෙන් හඳුන්වයි. පැරණි ශිලා ලිපිවල වැව් හමික, වපි හමික ලෙස හඳුන්වා ඇත්තේ ගම් වැව් තැනවූ අය හෝ එබඳු වැව් අයිතිව සිටි අය විය හැකි ය.

විශාල කුඹුරු වගා කිරීමට ගම් වැව්වල ජලය ප්‍රමාණවත් නොවීම නිසා රජවරු විශාල වැව් අමුණු ඉදි කළහ. උදාහරණයක් ලෙස මින්නේරිය වැව තැනවූ මහසෙන් රජු පසු කාලයේ දී මින්නේරි දෙවියන් ලෙස ප්‍රචලිත වූයේ වාරි කර්මාන්තයට කළ විශිෂ්ට සේවය නිසා ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

වී වගා කිරීම වර්ෂයකට දෙවරක් සිදු වී ඇත. ඒවා කන්න යනුවෙන් හඳුන්වයි. එවැනි කන්න දෙකක් පිළිබඳව නිතර සඳහන් වේ.

- ✦ මහ කන්නය
- ✦ යල කන්නය

මෙම කන්න දෙකට අමතරව ඇතැම් විට මැද කන්නයක් ද වගා කර ඇත.

තෝනිගල ශිලා ලිපියේ අකල හස (මහ කන්නය) මදහස (මැද කන්නය) පිට දඩ හස (යල කන්නය) යනුවෙන් කන්න තුනක් පැවති බව සඳහන් වේ.

මී ගවයන් බැඳි නගුල යොදා ගනිමින් කුඹුර වගාවට සුදුසු පරිදි පස බුරුල් කිරීම සිදු කරයි. එය සී සෑම ලෙස හැඳින්වේ. පස් පෙරළීම නිසා වල් පැළ තැලී පොඩි වී ස්වාභාවිකව ම පොහොර බවට පත් වේ. වර්තමානයේ භාවිත කරන යන්ත්‍ර සූත්‍රවලින් භූමියට හානි සිදු වුවත් පුරාණ සී සෑමේ ක්‍රම පරිසරයට අහිතකර නොවී ය.

වගාවට අවශ්‍ය ජලය රඳවා තබා ගැනීමටත් ක්‍රමානුකූලව ජලය පිටතට යැවීමටත් සුදුසු පරිදි ගොවියා විසින් ලියදි සකස් කිරීම සිදු කරන ලදි. මෙසේ කුඹුර සකස් කර ගැනීමෙන් පසුව වී වර්ග වැපිරීම සිදු කෙරිණි.



**රූපය 1.4 සී සෑම**

වී වගා කිරීම සඳහා කුඹුරක් සකස් කර ගැනීමට ගොවියාට බොහෝ වෙහෙස වීමට සිදු විය. ඒ සඳහා ගොවියා සිදු කළ යුතු කාර්යයන් ගණනාවක් විය.

වී වගාවට වැඩි වශයෙන් කෘමීන් හා කුරුල්ලන් වැනි සතුන්ගෙන් හානි සිදු වේ. පැළ සිටුවීමේ සිට අස්වනු නෙළා ගන්නා තෙක් ගොයම ආරක්ෂා කර ගැනීමට විවිධ සාම්ප්‍රදායික ක්‍රම භාවිත කර තිබේ.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

☆ නියරවල සහ කුඹුරේ තැන තැන පොල්පිති සිටුවීම

☆ තෙල් පොගවන ලද පහන් තිර පත්තු කිරීම එවැනි සාම්ප්‍රදයික ක්‍රම කිහිපයකි

තෙල් පොඟවන ලද පහන් තිර කුඹුරේ පත්තු කිරීම සිදු කළේ රෙදි පාන්කඩ ඉරා තිර ලෙස අඹරා මී තෙලෙන් පොඟවා කදුරු කෝටුවල බැඳීමෙනි. මැස්සන් මර්දනය කිරීමට මෙම ස්වාභාවික ක්‍රමය අතීතයේ ඉතා ම ජනප්‍රිය විය.

නගුල, පෝරු, දෑකැති හා උදලු වැනි උපකරණ කුඹුරු ගොවිතැන් කටයුතුවල දී යොදා ගෙන තිබේ. නිසි පරිදි ගොයම් පැසුණු විට කුඹුරේ අස්වැන්න නෙළීම අරඹා ඇත. අතීතයේ දී එය මුළුමනින් ම සිදු වූයේ මිනිස් ශ්‍රමයෙනි. කපාගත් ගොයම් හරකුන් යොදාගෙන පාගා ලබා ගත් වී පරිහරණයට ගන්නා තෙක් ආරක්ෂා සහිතව තැන්පත් කිරීම සඳහා කටයුතු කර ඇත.

පැරණි ගොවියෝ මේ සඳහා වී බිස්සක් නිර්මාණය කළහ.

කැකුළු සහල් හා තැම්බූ සහල් යනුවෙන් වී සකස් කර ගෙන ආහාරයට යොදා ගෙන ඇත. වී කොටා කැකුළු සහල් සාදා ගන්නා අතර වී තම්බා වේලා කොටා ගැනීමෙන් තැම්බූ සහල් සාදා ගනියි.

ඊළඟ කන්නයේ වගා කටයුතු ආරම්භ කරන තෙක් පුරාණ ගැමියෝ ආහාර නාස්තිය වළක්වා ගනිමින් අරපිරිමැස්මෙන් වී ප්‍රයෝජනයට ගැනීමේ හොඳ ගුණාංග පුරුදු පුහුණු වී සිටිය හ.



රූපය 1.5 පැරණි දෑකැත්තක්



රූපය 1.6 සාමූහික ව ගොයම් කැපීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රූපය 1.7 වී බිස්ස

### ක්‍රියාකාරකම

මඩ ගොවිතැන ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වගා කළ කන්න | විශේෂ ලක්ෂණ | භාවිත කළ වචන | භාවිත කළ උපකරණ |
|---|---|---|---|
| | | | |

## සත්ව පාලනය

ඉහත සඳහන් කළ පේන් ගොවිතැන හා කුඹුරු ගොවිතැන හැරුණු විට සත්ව පාලනය ද එකල ප්‍රධාන ජීවන ක්‍රමයක් ලෙස පැවතිණි. සත්ව පාලනය යනු මස්, කිරි, බිත්තර ආදිය ලබා ගැනීම පිණිස මෙන්ම කෘෂිකර්මාන්තය හා ප්‍රවාහනය වැනි කටයුතු සඳහා යොදා ගැනීමට සතුන් ඇති කිරීම ය. මෙහි දී ගවයා, එළුවා, කුකුළා, ඌරා, වැනි සතුන් අතීතයේ සිට මෙරට සත්ව පාලනයට යොදා ගෙන ඇත.

මඩ ගොවිතැනේ දී භාවිත කළ වචන

ගොයම් මැඩීම - ගොයම් පෑගීම

ගොයම් කොළය -කපා ගත් ගොයම් එකතු කොට සකස් කර ගත් ගොයම් ගොඩ

කමත - ගොයම් පෑගීම සිදු කළ ස්ථානය

ගවයා යනු කිරි ලබා ගැනීමට මෙන්ම කෘෂිකර්මාන්තය හා ප්‍රවාහනය සඳහා යොදා ගත් සත්වයෙකි. මේ නිසා ගව පාලනය පැරණි සමාජයේ බොහෝ ප්‍රචලිත ව තිබිණි. කිරි ලබා ගැනීම සඳහා යොදා ගත් ගව දෙනුන් **කිරි ගෙරි** ලෙස හඳුන්වා ඇත. අතීතයේ දී **කිරි, දී කිරි, මෝරු, ගිතෙල්, වෙඬරු** වශයෙන් ගවයාගෙන් පෝෂණ ද්‍රව්‍ය පහක් ලබා ගෙන ඇත. මේවා **පස් ගෝ රස** යනුවෙන් හැඳින්වේ. අතීතයේ දී මස් පිණිස ගවයන් ඇති කිරීම සිදු නොවූ අතර ගව මස් ආහාරයට ගැනීම ප්‍රචලිත ව නොතිබුණි. ගව පාලනයේ දී ගවයන් රැක බලා ගැනීම සහ තණ කැවීම ආදියෙහි නිරත වූ පුද්ගලයන් ගොපල්ලන් ලෙස හැඳින්විණි. පැරණි මූලාශ්‍රයවල මෙම පුද්ගලයන් ජීවත් වූ ගම් ගෝපාල ගම් ලෙස දක්වා ඇත.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මහාවංසයේ සඳහන්වන පරිදි පණ්ඩුකාභය රජතුමා ළමා කාලය ගත කර ඇත්තේ දෙරමඩලාව නම් ගොපලු ගමේ ය.



රූපය 1.8 තවලම

වර්තමානයේ මෙන් දියුණු ප්‍රවාහන ක්‍රම අතීතයේ නොතිබුණු නිසා භාණ්ඩ හා මිනිසුන් ප්‍රවාහනය කිරීම සඳහා ගවයා යොදා ගෙන ඇත. **ගැල් මීවුන්, ගැල් ගොන්** යනුවෙන් ප්‍රවාහන කටයුතු වලට යොදා ගත් ගවයින් හඳුන්වා තිබේ. ගවයින්ගේ පිටේ භාණ්ඩ රැගෙන යාම තවලම ලෙස හැඳින්වේ.

බිත්තර, මස් ආදිය ලබා ගැනීම සඳහා කුකුළු පාලනය පැවතිණ. මීට අමතර ව කිරි හා මස් ලබා ගැනීමට එළුවන් ඇති කළ බව පෙනේ.



රූපය 1.9 සතුන් යොදා ගෙන ගොයම් මැඩීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## කර්මාන්ත

අතීත ජනතාවගේ විවිධ අවශ්‍යතා සඳහා කර්මාන්ත බිහි කරගෙන තිබුණි. එක් එක් භාණ්ඩ හා ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට විශේෂ හැකියාවක් ඇති පිරිස් මෙම කර්මාන්ත ආශ්‍රිත ව වැඩ කළහ. මේ පිරිස් ශිල්පීන් ලෙස හැඳින්වූ අතර ඇතැම් විට කණ්ඩායම් ලෙස ජීවත් වූහ. අමුද්‍රව්‍ය පහසුවෙන් ලබා ගත හැකි ප්‍රදේශ ආශ්‍රිත ව කර්මාන්ත බිහි වී තිබූ බව පෙනේ. පහත සඳහන් වන්නේ එසේ පැවති කර්මාන්ත කිහිපයකි.

| කර්මාන්තය | ශිල්පීන් | නිෂ්පාදිත භාණ්ඩ |
|---|---|---|
| ලෝහ<br>(යකඩ, තඹ, රන්, රිදී) | යකඩ වැඩ කරන්නන්<br>ලෝකුරුවන්<br><br><br><br>රත්‍රං වැඩ කරන්නන්<br>රන්කරුවන්<br>(ස්වර්ණකාර)<br><br>තඹ ආශ්‍රිත ශිල්පීන්<br>තඹකර | කෘෂි උපකරණ<br>කැති, පොරෝ, දෑකැති, නගුල්,<br>දුණු, කඩු, පලිහ, හෙල්ල<br><br>මාල, වළලු, කරාබු, හිස පලඳනා ආදිය<br><br><br>තඹ නිර්මාණ |



රූපය 1.11 වම්පසින් යකඩ කර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන මයිනහම

දකුණු පසින් පුරාවිද්‍යා කැණීම්වලින් හමු වූ පැරණි යකඩ ඇණ කිහිපයක්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| කර්මාන්තය | ශිල්පීන් | නිෂ්පාදිත භාණ්ඩ |
|---|---|---|
| මැටි | වළං සාදන්නන් (කුම්බකාර/කුඹල්ලු) | උළු, ගඩොල්, වළං |



රූපය 1.12 සකපෝරුව භාවිත කරමින් මැටි භාණ්ඩ තැනීම

| කර්මාන්තය | ශිල්පීන් | නිෂ්පාදිත භාණ්ඩ |
|---|---|---|
| උක් | | පැණි, හකුරු,සීනි |
| කපු (පේෂ කර්මාන්තය) | පෙහෙකාර | රෙදි පිළි |
| මැණික් | මණිකර | මැණික් කැපීම, ඔප දැමීම |

## ක්‍රියාකාරකම

අතීත ශ්‍රී ලංකාවේ කර්මාන්ත පිළිබඳ තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| කර්මාන්තය | ශිල්පීන් | නිෂ්පාදන භාණ්ඩ | භාවිත කළ උපාංග |
|---|---|---|---|
| | | | |

## වෙළෙඳාම

වෙළෙඳාම යනු අතීත ජනතාවගේ තවත් එක් ප්‍රධාන ජීවනෝපාය ක්‍රමයකි. මේ නිසා අතීත ශ්‍රී ලංකාවේ ඉතා දියුණු වෙළෙඳාමක් පැවතිණ. වර්තමානයේ මෙන් අතීතයේ දී ද වෙළෙඳාම දෙයාකාරයකින් සිදු විය.

1. රට ඇතුළත සිදු කළ වෙළෙඳම
2. රටින් පිටත විදේශ රටවල් සමග සිදු කළ වෙළෙඳාම

රට ඇතුළත වෙළෙඳාම අභ්‍යන්තර වෙළෙඳාම ලෙසත්, විදේශ රටවල් සමග වෙළෙඳාම බාහිර වෙළෙඳාම හෝ විදේශ වෙළෙඳාම ලෙසත් හැඳින් වේ.

## අභ්‍යන්තර වෙළෙඳාම

අභ්‍යන්තර වෙළෙඳාම සඳහා බහුල ව භාණ්ඩ හුවමාරු ක්‍රමය සිදු වුවත් කාසි භාවිතය ඉතා සුළු වශයෙන් තිබිණ.

භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු කර ගැනීම භාණ්ඩ හුවමාරුව නම් වේ. භාණ්ඩ මිල දී ගැනීමට මුදල් ගෙවිය යුතු වුවත් මෙහි දී මුදල් වෙනුවට භාණ්ඩ ලබා දීම මගින් ගෙවීම සිදු වේ.

වෙළෙඳාම දියුණු වීමත් සමඟ වෙළෙඳ නගර බිහි විය. අනුරාධපුරය, මාගම එවැනි වෙළෙඳ නගර දෙකකි. ඇතැම්විට මෙබඳු වෙළෙඳ නගර මූලාශ්‍රයවල නිගම යනුවෙන් හඳුන්වා ඇත. වෙළෙඳාමෙන් ධනවත් වූ අය මෙම නගරවල ජීවත් වූහ. මේ පිරිස් අතර දේශීය මෙන් ම විදේශීය ජනයා ද සිටි බව පෙනේ. වෙළෙඳාමට සම්බන්ධ අය වෙන ම කණ්ඩායමක් ලෙස සංවිධානය වූහ. එවැනි වෙළෙඳ සංවිධාන "පූග" යනුවෙන් හඳුන්වා ඇත. විදේශිය වෙළෙන්දන් සංවිධානය වී සිටි වෙළෙඳ ශ්‍රේණි කිහිපයක් විය. නානාදේසි සහ වලඤ්ජියාර් එම වෙළෙඳ ශ්‍රේණිවලට උදාහරණ වේ. මේ එක් එක් වෙළෙඳ ශ්‍රේණි තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සංකේත භාවිත කර ඇත. ඒවා මුද්‍රා ලෙස හැඳින්වේ.




රූපය 1.13 අම්පාර රජගල පුරාවිද්‍යා භූමියෙන් ලැබුණු හස්ඵබු කහාපණ කාසියක් (වම්පස කාසිය ද දකුණුපස අනුරුවක් ද දැක්වේ)

හස්ඵබු කහාපණ යනු දැනට වසර දෙදහසකට පමණ පෙර ලංකාවේ භාවිතා වූ මුල්ම කාසි විශේෂයකි. රිදියෙන් තැනවූ මෙම කාසියේ පත්‍ර සහිත ගසක්, හස්ති රූපයක් හා සූර්යා ආදි සංකේත යොදා ඇත. ක්‍රි.පූ පළමුවන සියවසවන විට අනුරාධපුරය හැරුණු විට සෙසු ප්‍රදේශවල ද කාසි භාවිතය ප්‍රචලිතව තිබූ බව අම්පාර ප්‍රදේශයෙන් මෙම කාසිය ලැබීමෙන් පැහැදිලි වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නගරවලට අමතර ව වෙළෙඳමට සම්බන්ධ වෙළෙඳ ගම් ද පැවතිණ. පට්ටන ගම් හෝ පටුන් ගම් යනුවෙන් එබඳු වෙළෙඳ ගම් හඳුන්වා ඇත. නගරයේ වෙළෙඳසැල්වල විවිධ භාණ්ඩ විකුණන ලදි.

වළං, රෙදි පිළි, ආභරණ, කෑම බීම ඊට උදාහරණ වේ.

මාගම සිට පැමිණි සුරනිමල යෝධයා අනුරාධපුරයේ පිහිටි වෙළෙඳ සැලකින් සුවඳ විලවුන් මිල දී ගැනීමේ සිද්ධියක් පිළිබඳ ව මූලාශ්‍රයවල සඳහන් වේ.

හතරවන උදය රජතුමා (ක්‍රි.ව. 946 - 954) මහියංගන විහාරයට පැමිණි අවස්ථාවක ඒ අසල සොරබොර ප්‍රදේශයේ පිහිටි හෝපිටිගමු වෙළෙඳපොළෙහි අකටයුතුකම් සිදු වන බව ප්‍රදේශවාසීහු රජුට පැමිණිලි කළහ. එම අකටයුතුකම් නතර කරවීම සඳහා රජතුමා විසින් ශිලා ලිපියක් පිහිටුවන ලදි. එය බදුලු ටැම් ලිපිය ලෙස හැඳින්වේ. එහි දැක්වෙන වෙළෙඳපොළ පාලනයට අදාළ නීති රීති කිහිපයක් මෙසේ ය.

- වෙළෙඳපොළට ගෙනෙන බඩු පෙර මගට ගොස් නොගත යුතු ය.
- අනුමත නොකළ තරාදි පඩි භාවිතා නොකළ යුතු ය.
- බුලත්, පුවක් ආදිය නියමිත මණ්ඩප වල තබා විකිණිය යුතු ය.
- වෙළෙඳපළට ගෙනෙන භාණ්ඩ විකුණුවොත් මිස ඒවා වෙළෙඳපල හරහා ගෙන ගියාට බදු අය නොකළ යුතු ය.

### ක්‍රියාකාරකම

පැරණි ලංකාවේ අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳව වාක්‍ය පහක් ලියන්න.

## විදේශ වෙළෙඳාම

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටා තිබීම නිසා අතීතයේ සිට ම විදේශීය රටවල් සමග ඉතා දියුණු වෙළෙඳ සම්බන්ධතා පවත්වා ඇත. ඉන්දියාව, චීනය, රෝමය, පර්සියාව, අරාබිය, අග්නිදිග අසියාව එම රටවල් විය.

එවකට රටේ තිබුණු ඇත් දත්, මුතු, මැණික්, කුළුබඩු, ඖෂධ වර්ග, වටිනා දැව, ඇතුන් ආදිය විදේශ රටවලට වෙළඳාම් කෙරිණි. ශ්‍රී ලංකාව රත්නදීප (මැණික් දිවයින) යනුවෙන් අතීතයේ දී හඳුන්වා ඇත්තේ අපේ රට මැණික්වලට ප්‍රසිද්ධ ව තිබුණු නිසා ය.

පිඟන්, සේද රෙදි, සුවඳ විලවුන්, අශ්වයින් වැනි දෑ විදේශ රටවලින් මෙරටට ගෙන එන ලදී.

ශ්‍රී ලංකාවේ මාතොට (මන්නාරම), ගෝකණ්ණ (ත්‍රිකුණාමලය), ගොඩවාය (හම්බන්තොට පිහිටි) වැනි ස්වාභාවික වරායන් විදේශ වෙළෙඳාමේ දී වැදගත් විය.

පිටරටින් ගෙන්වන භාණ්ඩ (ආනයනය කරන ලද) සහ පිටරට යවන භාණ්ඩ (අපනයනය කරන ලද) ගොඩබෑම සහ පැටවීම සිදු කළේ මෙබඳු වරායන් මගිනි.



රූපය 1.14 ශ්‍රී ලංකාවෙන් හමු වූ චීන මැටි බඳුන්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පුරාවිද්‍යා කැණීම් මගින් අතීතයේ මෙරටට ආනයනය කළ විදේශීය භාණ්ඩවල කොටස්, විවිධ රටවලට අයත් කාසි වර්ග සොයා ගෙන ඇත. අනුරාධපුර රාජධානිය පාලනය කළ භාතිකාභය රජතුමා රුවන්වැලිසෑය අලංකාර කිරීමට සකස් කළ පළඳනාවට අවශ්‍ය පබලු ගෙන්වා ගැනීම සඳහා රෝමයට මෙරටින් දූතයන් යැවූ බව මූලාශ්‍රයවල සඳහන් වේ. මෙම වෙළෙඳ කටයුතු බහුල ව සිදු කළේ මුහුදු මාර්ග ඔස්සේ ය. භාණ්ඩ හා මිනිසුන්



රූපය 1.15 ශ්‍රී ලංකාවෙන් හමුවූ පුරාණ චීන කාසි කිහිපයක්

ප්‍රවාහනය කිරීමට එක් එක් ප්‍රමාණයේ නැව් යොදා ගැනිණ. මේ නිසා ඉන්දියාව, පර්සියාව වැනි රටවලට අයත් නැව් නිරන්තරයෙන් ම ලංකාවට පැමිණි බවට තොරතුරු ලැබේ.

ශ්‍රී ලංකාවට අයත් තට්ටු හා පඩි පේළිවලින් යුක්ත ශක්තිමත් නැව් චීනයේ වරායවල තිබූ බව චීන මූලාශ්‍රය වල සඳහන් වේ.

විදේශීය වෙළෙඳ කටයුතු පාලනය කිරීමට ද විවිධ නිලධාරින් යොදා තිබිණි. මේ අතුරින් වරාය ආශ්‍රිත ව කටයුතු කළ නිලධාරින් (රේගු නිලධාරින්) පිළිබඳ ව තොරතුරු ලැබී ඇත.

වරායවලට පැමිණෙන නැව්වලින් බදු එකතු කිරීම මෙම නිලධාරින්ට අයත් කාර්යක් විය. උදාහරණයක් ලෙස ගොඩවාය වරායෙන් අයකරගත් රේගු බදු ගැන සඳහන් වේ.

**ක්‍රියාකාරකම**

විදේශ වෙළෙඳාම ඇසුරින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| වෙළෙඳාමට සම්බන්ධ රටවල් | ආනයනය කරන ලද භාණ්ඩ | අපනයනය කරන ලද භාණ්ඩ | ශ්‍රී ලංකාවේ වරායන් |
|---|---|---|---|
| | | | |

## සංස්කෘතිය

ශ්‍රී ලංකාව යනු විවිධ ජන කණ්ඩායම්වලට අයත් ජනතාවක් වාසය කරන රටකි. සිංහල, දෙමළ, මුස්ලිම් යනු එකී ජන කණ්ඩායම් වේ. මේ අය එක් එක් සංස්කෘතීන්වලට අයත් වේ. මේ නිසා අපේ රටේ විවිධ ජාතීන්ට අයත් සංස්කෘතික ලක්ෂණ දැක ගත හැකිය. සංස්කෘතිය යනු කිසියම් සමාජයක ජීවත්වන ජන කණ්ඩායමක ඇදහිලි, විශ්වාස, සිරිත් විරිත්, සමාජ පුරුදු, ඇඳුම් පැලඳුම්, ආහාර රටාව, ආචාරධර්ම, රසවින්දනය යනාදී ලක්ෂණ සියල්ලේ ම එකතුවක් ලෙස දැක්විය හැකි ය.

දේවානම්පියතිස්ස රජතුමාගේ පාලන සමයේ දී අපේ රටට බුදුදහම හඳුන්වා දීමෙන් අතීත සමාජය තුළ විශාල පරිවර්තනයක් සිදු විය. මේ නිසා සමාජයට විනයක් හා ශික්ෂණයක් ලැබුණි. එකිනෙකාට උපකාර කර ගැනීම හෙවත් අන්‍යොන්‍ය සහයෝගය වර්ධනය විය. දාගැබ් ඉදි කිරීම, විහාරාරාම තැනවීම, වැව් අමුණු බැඳීම, මංමාවත් සැකසීම වැනි පොදු කටයුතුවල දී සියලු දෙනා ඒකරාශී වී සාමූහික ව කටයුතු කළ බව පෙනේ. එබඳු ගුණාංග වර්තමාන සමාජයට වුව ද අතීතයෙන් ලබා ගත හැකි මහඟු ආදර්ශ වේ. අතීත සමාජයේ පැවති යහපත් සිරිත් විරිත් පිළිඹිබු වන අවස්ථා කිහිපයක් උදාහරණ වශයෙන් ගෙන මේ තත්ත්වය තවදුරටත් විමසා බලමු.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

## අත්තම් ක්‍රමය

ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීම අත්තම් ක්‍රමය ලෙස සරල ව හඳුන්වා දිය හැකිය. අපේ රටේ ජීවත් වුණු බොහෝ පිරිසකගේ ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තය වුවත් ඒ සඳහා යොදගත්තේ පවුලේ ශ්‍රමයයි. එහෙත් ගොයම් කැපීම වැනි කටයුතු සඳහා විශාල පිරිසකගේ ශ්‍රමය අවශ්‍ය විය. මේ සඳහා ගොවීහු අසල්වාසීන් තම කටයුතුවලට සම්බන්ධ කර ගත්හ. මේ නිසා එකිනෙකා අතර සුහදශීලි බව සහයෝගය හා උපකාර කිරීම වැනි ගුණාංග වර්ධනය විය.

තමාට කළ උපකාරයට ප්‍රති උපකාර කිරීමක් ලෙස ගොවියා අනෙක් අයගේ කටයුතු සඳහා ඒ හා සමාන ව ශ්‍රමයෙන් දයක වීමේ ක්‍රමය අතීත සමාජයේ පැවතිණ. අත්තම් ක්‍රමය එයට උදහරණයකි. සාමාන්‍ය ජනතාව පමණක් නොව අතීත රජවරු ද ගොවිතැන් කටයුතුවලට සම්බන්ධ වූ ආකාරය පිළිබඳ කථා පුවත් මූලාශ්‍රයවල සඳහන් වේ.

අනුරාධපුර රාජධානි අවධියේ රජ කළ මහාචූලි මහා තිස්ස රජතුමා ශ්‍රමිකයෙකු ලෙස වෙස්වලාගෙන කුඹුරක අස්වනු නෙලීමට සහභාගි වීමේ කථා පුවතක් පිළිබඳ ව සඳහන් වේ.

## විවාහය

විවාහය යනු සෑම පුද්ගලයෙකුගේ ම ජීවිතයේ සුවිශේෂී අවස්ථාවකි. අතීත සමාජය විවාහය යන්න ඉතා ගෞරවනීය දෙයක් ලෙස සැලකිණ. ඒ මන් ද යත් පවුල නමැති ඒකකය ගොඩනැගෙන්නේ විවාහය නිසාවෙනි. අතීතයේ දී තම පවුලට, පෙළපතට ගැළපෙන විවාහයක් දූ පුතුන්ට සිදු කර දීමට දෙමාපියෝ වෙහෙසී කටයුතු කළහ. දෙමාපියන්ගේ කැමැත්ත හා ආශිර්වාද මැද සිරිත් විරිත් ඉටු කරමින් විවාහ ජීවිතයට ඇතුළු වීම අතීත ජන සමාජයේ පිළිගත් ක්‍රමය විය. චරිතවත් හා ගුණවත් ලෙස හැදී වැඩුණු දරුවන් වැඩිහිටියන්ගේ ප්‍රසාදයට ලක් විය. වර්තමානයේ මෙන් විසිතුරු විලාසිතාවන්ගෙන් නොවුනත් අතීත විවාහ ක්‍රමය චාම්, අර්ථවත් හා ගෞරවාන්විත ව සිදු විය.

දෙමාපිය රැකවරණය යටතේ දියණියන් හැදී වැඩිය යුතු විය. ආහාර පිළියෙල කිරීම, නිවසේ පිරිසිදු කටයුතු, අලංකරණ කටයුතු සම්බන්ධ ව හොඳ පුහුණුවක් ඔවුන් ලැබිය යුතු විය.

දියණිවරු සූප ශාස්ත්‍රයෙන් (ආහාර පිසීම) දක්ෂයින් කිරීම, දෙමාපියන්ගේ වගකීමක් බව සහස්සවත්ථුපකරණයේ සඳහන් වේ.

සාලිය කුමාරයාගේ බිසව වූ අශෝකමාලා රසවත් ලෙස ආහාර පිළියෙල කළ බව සද්ධර්මාලංකාරයේ සඳහන් වේ.

සූප ශාස්ත්‍රයෙන් දක්ෂ කාන්තාවන් **මධුපාචිකා** යනුවෙන් මූලාශ්‍රයවල සඳහන් කර ඇත.

අතීතයේ දී දරුවන් තම පවුල පෝෂණය කිරීමට හා එය මනා ලෙස පවත්වාගෙන යාමට දෙමාපියන් යටතේ දී පුරුදු පුහුණු වූ ආකාරය අපට හොඳ ආදර්ශයකි.

## අවමංගල්‍ය

අතීත සමාජයේ අවමංගල්‍ය කටයුතු පිළිබඳව බලන විට විවිධ ජන කොටස්වලට වෙන් වූ සුසාන භූමි තිබී ඇත. ආදහනය, ආදහනයෙන් පසු භස්මාවශේෂ භූමදන කිරීම සහ මෘත දේහ වනගත සොහොන්වල තැන්පත් කිරීම සිදු කර ඇත.

පණ්ඩුකාභය රාජ්‍ය අවදියේ මළ සිරුරු ගෙන යාමට සොහොන් පල්ලන් 150 ක් ද චන්ඩාල කුලයේ අය සඳහා වෙනමම සුසාන භූමියක් ද වෙන් කර තිබූ බව මහාවංසයේ සඳහන් වේ. මළ සිරුරු රෙද්දකින් ඔතා මැස්සක තබා හතර දෙනෙකු ඔසවාගෙන ගිය බව ඇතැම් මූලාශ්‍රයවල සඳහන් වේ.

යම් කිසි පුද්ගලයෙකු මියගිය පසු එම තැනැත්තාගේ ඥාතීන් ඊළඟට එම පවුලේ සිටින ප්‍රධානියාට ඇතැම් විට මිල මුදල් පරිත්‍යාග කර ඇත. කිසියම් ආර්ථික අපහසුතාවක් සිදු වුවහොත් ඊට පිළියමක් ලෙස එවැනි සත් කාර්යයන් සිදු කරන්නට ඇත. ඥාතියෙකුගේ, අසල්වාසියකුගේ විපතක දී හෝ දුකක දී නොපැකිලි ව පිහිටවීමට ඉදිරිපත් වීම අපේ පැරණි ජනතාව සතු උසස් ගුණාංගයක් විය.

ආගමික ස්ථානයක් ඉදිරියෙන් ගමන් ගන්නා විට අවමගුල් පෙරහැරවල මළ බෙර වාදනය නොකිරීම ද එවකට පැවති චාරිත්‍රයකි.

## සිරිත් විරිත් හා සාරධර්ම

දිගු ඉතිහාසයක් ඇති අපේ සමාජය සිරිත් විරිත් හා සාරධර්මවලින් පොහොසත් ය. තම යුතුකම් ගැන සැලකිල්ලක් දක් වූ අතීත ජනයා වැඩිහිටියන්ට ගරු කිරීම, සැලකීම වැනි දේ නොපිරිහෙලා ඉටු කළහ. සාමාන්‍ය ජනතාව පමණක් නොව රජවරුද තම දෙමාපියන්ට සැලකූ ආකාරය පිළිබඳ උදහරණ මූලාශ්‍රය වලින් හමු වේ. අනුරාධපුර රාජධානි අවදියේ රජ කළ අටවන අග්ගබෝධි රජතුමා තම මවට ඇප උපස්ථාන කළ ආකාරය මහාවංසයේ සඳහන් වේ.

දිවා රාත්‍රී මවට උපස්ථාන කිරීමෙන් රජතුමා බොහෝ සතුටට පත් ව ඇත. අලුයම් කාලයේ දී ම එම උපස්ථාන කටයුතු පටන් ගෙන **"තෙල් ගල්වා, හිස පිරිමැද, දහඩිය පිරිසිදු කොට සුවඳ විලවුන් ගල්වා ඇය සැතැප්පීය. නිය කපා පිරිසිදු කොට ඇය නැහැවීය. සුව පහසු ඇඳුම් අන්දවා තම දෑතින් ම කිලිටි වස්ත්‍ර පිරිසිදු කළේ ය"** යනාදී වශයෙන් මහාවංසයේ ඒ ගැන දක්වා තිබේ.

අතීත ජනයා ආගමානුකූල ව හා ධාර්මික ජීවිත ගත කළ පිරිසකි. තමාගේ ශක්ති ප්‍රමාණයෙන් දනමාන ආදිය දෙමින් කුසල් රැ ස් කර ගනිමින් යහපත් පුරවැසියන් ලෙස ජීවත් වූ පිරිසක් බව අතීත තොරතුරුවලින් පැහැදිලි වේ.

### ක්‍රියාකාරකම

අතීත ජන සමාජයෙන් වර්තමාන සමාජයට ගත හැකි ආදර්ශ යන මැයෙන් රචනාවක් ලියන්න.

### සාරාංශය

- කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ වෙළෙඳාම අතීත ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය ක්‍රම විය.
- හේන් වගාව අතීතයේ සිදු වූ මුල් ම වගා ක්‍රමය ලෙස සැලකේ. මේ වගා යටතේ ජනතාවගේ යැපීම සඳහා අවශ්‍ය ධාන්‍ය, අල වර්ග, එළවළු, පලතුරු නිෂ්පාදනය කරන ලදී.
- වී වගාව ද හේන් වගාවක් ලෙස සිදු කළත් ජනගහනය වැඩි වීමත් සමග මහා පරිමාණයෙන් කුඹුරු ගොවිතැන සිදු විය.
- වී වගා කරන කන්න දෙකක් පැවතිය ද අතීතයේ යල සහ මහ කන්නයට අමතර මැද කන්නයක් ද වගා කර ඇත.
- ආහාර නාස්තිය වළක්වා ගැනීමට හා අනාගත පරිභෝජනය සඳහා ආහාර සුරක්ෂිතතාව සඳහා අතීත ජනතාව පුරුදු පුහුණු වී සිටියහ. වී බිස්ස මීට හොඳ උදහරණයකි.
- කර්මාන්ත ආශ්‍රිත ව සුවිශේෂී හැකියාවන්ගෙන් යුතු පිරිස් වලින් සමන්විත ශිල්පී ශ්‍රේණි පැවතීම.
- ශ්‍රී ලංකාව අතීතයේ සිට ඉන්දියාව, ග්‍රීක, පර්සියා, අරාබිය, චීනය, අග්නිදිග ආසියාව වැනි රටවල් සමග දියුණු වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීම.
- අතීතයේ විසූ ජනතාව දෙමාපියන්ට සැලකීම වැනි උසස් ගුණාංග සහ සිරිත් විරිත් නොපිරිහෙලා ඉටු කරමින් අන්‍යෝන්‍ය සහයෝගයෙන් ජීවත් වූ පිරිසක් වීම.